දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி )
e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය )
இணையத்தளம் )
website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 18-12-2012
Date )

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
# Ministry of Health

To all PDHS & RDHS

**<u>Steps to be taken to prevent spread of comunicable diseases resulting from floods</u>**

Due to the prevailing adverse weather conditions floods are experienced in some parts of the country causing inconvenience to the public.

The following guidelines are recommended to minimize the adverse public health impact and prevent the spread of communicable diseases among the displaced population accommodated in temporary shelters.

Resulting floods and heavy rains may result in public health problems arising due to pollution of water supply, pollution of environment due to collection of debris and contamination of food

One of the main public health problems would be the likelihood of increase in incidence of water borne diseases such as dysentery and diarrhea. Therefore immediate measures should be taken at field level to prevent and control such a situation

**Dr. P. G. Mahipala**
**Director General of Health Services**

Copy: Addl. Secretary (PHS)
DDG (PHS) I & II
DDG (MS)
Chief Epidemiologist
Director (MCH)
Director (HE & P)
Director (MSD)
REE
MOOH

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தைஇ கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி )
e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය )
இணையத்தளம் )
website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 18-12-2012
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,

සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,

## අධික වැසි හා ගං වතුර හේතුවෙන් ජලය ආශ්‍රිත රෝග පැතිරයාම පාලනය හා එම රෝග වැළැක්වීම සඳහා ගත යුතු පියවර

දිවයිනේ සමහර ප්‍රදේශවල දැනට පවතින අධික වැසි සහිත කාලගුණය හා ඒ හේතුවෙන් ඇතිවිය හැකි ගංවතුර නිසා ජලය ආශ්‍රිතව පැතිර යන රෝග වැඩි වීමේ අවදානමක් ඇත. පානීය ජල මූලාශ්‍ර, නොපිසූ එළවළු සහ පළතුරු අපිරිසිදු වීම හා සනීපාරක්ෂක පද්ධතිය බිඳ වැටීම නිසා ජලය ආශ්‍රිතව පැතිර යන පාචනය, රක්ත අතීසාරය වැනි රෝගද, වැසි ජලය එකතු වන ස්ථාන බහුල වීම නිසා මදුරු වාහකයන් මහින් පැතිරෙන ඩෙංගු, චිකුන්ගුන්යා වැනි රෝගද පැතිරීමේ අවදානමක් ඇත. මෙම තත්වයන් පාලනය කිරීමට සහ වැළැක්වීමට ක්ෂේත්‍ර මට්ටමින් ක්ෂණික පියවර ගත යුතුය.

ඔබ ප්‍රදේශයේ අධික වැසි ඇත්නම් අනුගමනය කළයුතු මූලික ක්‍රියාමාර්ග පහත දැක්වේ.

1. ඔබ ප්‍රදේශයේ පිහිටුවා ඇති ආපදා කළමනාකරණ කමිටු කැඳවා පවතින තත්වය සහ ගත යුතු ක්‍රියා මාර්ග ගැන සාකච්ඡා කිරීම.
2. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමේ කුඩා කණ්ඩායම් පිහිටුවා අවදානම් සහිත ප්‍රදේශ වල අවශ්‍ය සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සිදු කිරීම. මේ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් සමග සාකච්ඡා කොට එම නිලධාරින් සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.
3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් / මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන් තම ප්‍රදේශවල වසංගත රෝග තත්වයන් ඇතිවීම සම්බන්ධයෙන් විමසිලිමත් විය යුතු අතර එවැනි තත්වයන් ඇති වුවහොත් තම ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ හට සහ කොළඹ වසංගත රෝග විද්‍යා

අංශයට වහාම දැනුම් දීමට හා එම වසංගත තත්වය පාලනය කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමට වග බලා ගත යුතුය.

4. මහජනතාවට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා දිය යුතු අතර මේ වැසි සමය තුළ උණුකර නිවාගත් ජලය පානය කිරීම සහ ආහාර වල පවිත්‍රතාවය රැක ගැනීම පිළිබඳව ඔවුන්ගේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

5. පානීය ජලය ලබා ගන්නා ළිං ක්ලෝරිනීකරණය කිරීම.

6. කැලි කසල සහ අනෙකුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීම.

සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරින් ඉහත දක්වා ඇති ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර එම ක්‍රියාකාරකම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් ගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු අතර තම ප්‍රදේශයේ වසංගත රෝග තත්වයන් වළක්වා ගැනීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහ ඔහුගේ / ඇයගේ කාර්යමණ්ඩලයේ කායඝික්ෂමතාව මත රඳා පවතී.ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ විසින් තම ප්‍රදේශයේ සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ වල සිදු කෙරෙන ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බලා අධීක්ෂණය කළ යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් මෙම කටයුතු වලදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන්, නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන් සහ වසංගත රෝග විද්‍යාඥගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.

වෛද්‍ය පී. ජී. මහීපාල
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් :

අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) I සහ II
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා)
අධ්‍යක්ෂ (වසංගත රෝග විද්‍යා අංශය)
අධ්‍යක්ෂ (සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය)
අධ්‍යක්ෂ (මාතෘ හා ළමා)
අධ්‍යක්ෂ (වෛද්‍ය පර්යේෂණායතනය)
අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයුම්)
සියළුම ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරුන්
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්